# දැන්වීමයි

## ශ්‍රම මිලදී ගැනීමේ පදනමින් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ කසල කළමනාකරණ කටයුතු වෙනුවෙන් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :- 8 ශ්‍රේණිය සමත් වී තිබීම.

<u>වෙනත් සුදුසුකම්</u> :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

<u>කොන්දේසි</u> :-

i. මෙය දෛනික පදනමින් බඳවාගනු ලැබීමක් වන අතර, ඉදිරියේ දී ස්ථිර පදනමින් බඳවාගැනීමට හේතුවක් නොවනු ඇත.
ii. කසල කළමනාකරණ කටයුතු සඳහා යොදවා ගන්නා බැවින්, එම සේවයේ යෙදීමට කැමති අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතුය.
iii. සේවා අවශ්‍යතාව මත සේවයේ යෙදවීමක් වන බැවින් කලින් දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ හැකියාව දොම්පෙ ප්‍රාදේශීය සභා ලේකම් සතුය.
iv. සේවය කරන මාසය සඳහා දීමනා ඊළඟ මස 10 වන දිනට ගෙවීම් කරනු ලැබේ.

<u>බඳවා ගැනීමේ ක්‍රමය</u> :- මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් සිදුකරනු ලබන අතර, ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

<u>අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය</u> :-

1) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පතක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි “ශ්‍රම පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවාගැනීම“ ලෙස සඳහන් කර 2026.10.10 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිඳිවැල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.
3) තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිවීමෙන් ආපසු හරවා යැවුනු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4) අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට එම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

   a. උප්පැන්න සහතිකය
   b. අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික
   c. පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය
   d. ජාතික හැඳුනුම්පත

ලේකම්
දොම්පෙ ප්‍රාදේශීය සභාව.
2026.09.22